# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2024 අංක 11 දරන ශ්‍රී ලංකා බැප්ටිස්ට් සංගමය (සංස්ථාගත කිරීමේ) (සංශෝධන) පනත

---

**[සහතිකය සටහන් කළේ 2024 පෙබරවාරි මස 19 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

---

2024 පෙබරවාරි මස 22 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකි ය.

**මිල :** රු. 12.00 **තැපැල් ගාස්තුව :** රු. 150.00

මෙම පනත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

## 2024 අංක 11 දරන ශ්‍රී ලංකා බැප්ටිස්ට් සංගමය (සංස්ථාගත කිරීමේ) (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2024 පෙබරවාරි මස 19 වන දින]

එල්. ඩී.– ඕ. (අයි. එන්. සී.) 13/2022

**(341 වන අධිකාරය වූ) ශ්‍රී ලංකා බැප්ටිස්ට් සංගමය (සංස්ථාගත කිරීමේ) ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි**

පූර්විකාව

(341 වන අධිකාරය වූ) ශ්‍රී ලංකා බැප්ටිස්ට් සංගමය ආඥාපනත මගින් ශ්‍රී ලංකා බැප්ටිස්ට් සංගමය සංස්ථාගත කර ඇති හෙයින් ද:

ලංකා බැප්ටිස්ට් සභාව යනුවෙන් විධිමත්ව හඳුන්වන ලද ශ්‍රී ලංකා බැප්ටිස්ට් සංගමයේ සාමාජිකයන් විසින් එකී සංගමයේ නාමය සංශෝධනය කිරීම සඳහා යෝජනා සම්මතයක් සම්මත කරගෙන ඇති හෙයින් ද, එකී යෝජනා සම්මතය බලාත්මක කිරීමේ කාර්යය සඳහා එකී සංගමයේ නාමය වෙනස් කිරීමට එකී සංගමය විසින් ඉල්ලා ඇති හෙයින් සහ එකී ඉල්ලීමට ඉඩ දීම ප්‍රඥාගෝචර වන හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:–

ලුහුඬු නාමය

**1.** මේ පනත 2024 අංක 11 දරන ශ්‍රී ලංකා බැප්ටිස්ට් සංගමය (සංස්ථාගත කිරීමේ) (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

341 වන අධිකාරයට කරනු ලබන පොදු සංශෝධන

**2.** (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) (341 වන අධිකාරය වූ) ශ්‍රී ලංකා බැප්ටිස්ට් සංගමය ආඥාපනතේ හෝ ඒ යටතේ සාදන ලද හෝ නිකුත් කරන ලද යම් රීතියක, දැන්වීමක හෝ වෙනත් ලේඛනයක (ශ්‍රී ලංකා බැප්ටිස්ට් සංගමයේ නාමයෙන් හෝ "සංගමය" යනුවෙන් ලුහුඬින් හෝ) ශ්‍රී ලංකා බැප්ටිස්ට් සංගමය සම්බන්ධයෙන් ඇති සෑම සඳහනක් ම අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස, "ශ්‍රී ලංකා බැප්ටිස්ට් සංගමය" හෝ "සංගමය" යන යෙදුම් වෙනුවට පිළිවෙළින් "ශ්‍රී ලංකා බැප්ටිස්ට් සභාව" හෝ "සභාව" යන යෙදුම්, අවස්ථාවෝචිත පරිදි, ආදේශ කරනු ලැබිය යුතු ය.

ගිවිසුම් ආදිය සම්බන්ධයෙන් ආරක්ෂා සැලසීම

**3.** (1) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වීමේ දිනයට පෙරාතුව සහ එම දිනය වන විට "ශ්‍රී ලංකා බැප්ටිස්ට් සංගමය" විසින් හෝ එකී සංගමය වෙනුවෙන් හෝ සාදන ලද, නිකුත් කරන ලද හෝ ලියා අත්සන් කරන ලද සියලු කොන්ත්‍රාත්තු, ගිවිසුම් හෝ වෙනත් සාධන පත්‍ර හෝ කවරාකාර හෝ ලේඛන, මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වීමේ දින සිට සහ ඉන්පසුව "ශ්‍රී ලංකා බැප්ටිස්ට් සභාව" විසින් හෝ එකී සභාව වෙනුවෙන් සාදනු ලැබූ, නිකුත් කරනු ලැබූ හෝ ලියා අත්සන් කරනු ලැබූ ලෙසට සලකනු ලැබිය යුතු ය.

(2) "ශ්‍රී ලංකා බැප්ටිස්ට් සංගමය" විසින් හෝ එයට එරෙහිව පවරනු ලැබ, මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වීමේ දිනයට පෙරාතුව ම වූ දිනයේ දී විභාග වෙමින් පැවති සියලුම නඩු, නඩුකටයුතු, අභියාචනා සහ අනෙකුත් නීති කෘත්‍ය නතර කිරීම හෝ පවත්වාගෙන යාම නතර කිරීම නොකළ යුතු අතර, ඒවා, "ශ්‍රී ලංකා බැප්ටිස්ට් සභාව" විසින් හෝ ඊට එරෙහිව නොකඩවා පවත්වාගෙන යා යුතු අතර, බලාත්මක කිරීම කරනු ලැබිය හැකි ය.

(3) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වීමේ දිනයට පෙරාතුව ම වූ දිනයේ දී (1) වන උපවගන්තියේ දක්වා ඇති අයිතිවාසිකම්, වගකීම් සහ බැඳීම් හැර "ශ්‍රී ලංකා බැප්ටිස්ට් සංගමයේ" සියලුම අයිතිවාසිකම්, වගකීම් සහ බැඳීම් "ශ්‍රී ලංකා බැප්ටිස්ට් සභාවේ" අයිතිවාසිකම්, වගකීම් සහ බැඳීම් ලෙස සලකනු ලැබිය යුතු ය.

සැක දුරු කිරීම

**4.** "ශ්‍රී ලංකා බැප්ටිස්ට් සභාව", සියලු කාර්ය සඳහා ප්‍රධාන ප්‍රඥප්තියේ 2 වන වගන්තිය මගින් සංස්ථාගත කරන ලද "ශ්‍රී ලංකා බැප්ටිස්ට් සංගමයේ" අනුප්‍රාප්තිකයා ලෙස සලකනු ලැබිය යුතු බවට යම් සැකයක් දුරු කිරීමේ කාර්යය සඳහා මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

**5.** මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත්, අංක 118, දෙස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 08,
රජයේ මුද්‍රණාලයේ පිහිටි "ප්‍රකාශන පියස" හි දී මිල දී ගත හැකි ය.